## නල්ලූර් ප්‍රාදේශිය සභා

1.0 . මූල්‍ය ප්‍රකාශන .

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම .

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 05 දින ඉදිරිපත් කරන ලදී . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 12 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය .

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නල්ලූර් ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දින නල්ලූර් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 . මල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් .

1.3.1 . ගණකාධිකරණ අඩුපාඩු .

මූල්‍ය ප්‍රකාශනයන් හි වත්කම් රු.43,197,733 කින් අඩුවෙන් දක්වා තිබුණි .

1.3.2 . විගණනය සඳහා සාක්ෂි නොමැති වීම .

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම .

( අ ) . විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,768,614 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සතනිරීක්ෂණය කිරීමට නොහැකි විය .

( ආ ) . ප්‍රාදේශීය සභා (මුදල් සහ පරිපාලන) රීති - 1988 හි 39 වගන්තිය ප්‍රකාර වරිපනම් ලිපිකරු විසින් දේපල තහනම් කිරීමේ වරෙන්තු බලපත්‍ර සහ පැහැර හරින්නන්ගේ ලැයිස්තු පවත්වා ගැනීම, දේපළ

තහනම් කරන නිලධාරියා ගේ ගෙවීම් උපලේඛන , පැහැර හැරීම් සම්බන්ධයෙන් දැන්වීම් ප්‍රසිද්ධ කළ සහ විකුණු දේපළ සහ දේපල තහනම් කරන නිලධාරීන් සඳහා වූ යම් විශේෂ උපදෙස් ආදිය සඳහා වෙනම ලිපි ගොනුවක් පවත්වා නොතිබුණි . එබැවින් දේපල තහනම් කරන නිලධාරීන්ට ගෙවන ලද රු.305,960 ක් වූ කොමිස් මුදල පිළිබඳව විගණනයේ දී සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය .

1.3.3 . අනුකූල නොවීම් .

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන් හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය .

| | නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | | අනුකූල නොවීම . |
|---|---|---|---|
| ( අ ) . | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 ( ඒ ) වගන්තිය . | - | විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව ආගමික සහ පොදු කටයුතු සඳහා වර්ෂයකට රු.1,000 ඉක්මවා වියදම් නොදැරිය යුතුය . මෙයට පටහැනිව , අමාත්‍යවරයා ගේ අනුමැතිය ලබා නොගෙන ආහාර පාන සඳහා රු.453,658 ක මුදලක් ගෙවා තිබුණි . |
| ( ආ ) . | ප්‍රාදේශීය සභා ( මුදල් සහ පරිපාලන ) රීති - 1988 | | |
| ( i ) . | i පරිච්ඡේදයේ 05 වගන්තියෙහි ( xii ) උප වගන්තිය | - | මුදල් සහ ගබඩා සම්බන්ධ කටයුතු කරන නිලධාරීන් ගෙන් ප්‍රමාණවත් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි . |
| ( ii ) . | iii පරිච්ඡේදයේ 65 වගන්තිය | - | ගෙවීම් සඳහා ලබා දී ඇති කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසුව ආදායම් ලිපිකරු විසින් පැහැර හරින්නන් ගේ ලැයිස්තුවක් සකස් කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි . |

( iii ) . iii පරිච්ඡේදයේ 66 වගන්තිය . - 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 150 ( 4 ) වගන්තිය ප්‍රකාරව ලැබිය යුතු බදු රු.5,611,399 ක් අය කර ගැනිම සඳහා ලේකම්වරයා කටයුතු කර නොතිබුණි .

( iv ) . v පරිච්ඡේදයේ 140 වගන්තිය . - නියමිත දිනයේ දී රු.2,021,060 ක් වූ අත්තිකාරම් ගෙවීමට අපොහොසත් වීම පිළිබඳව ලේකම්වරයා මගින් සභාපති වරයාගේ අවධානයට යොමු කර නොතිබුණි .

( ඇ ) . ආයතන සංග්‍රහය .

( i ) . x පරිච්ඡේදයේ 9 . 2 වගන්තිය . - ආදායම් පාලකසහ ආදායම් පරික්ෂක ගේ නිවාඩු දින වැටුප් 20 න් බෙදා ගණනය කර තිබුණු අතර වර්ෂය තුලදී රු.15,162 කමුදලක් වැඩිපුර ගෙවා තිබුණි .

( ii ) . xiv පරිච්ඡේදයේ 3 වගන්තිය . - ව සුඛෝපභෝගි බස් රථ වලින් කොළඹට ගමන් කළ නිලධාරින්ට ගමන් වියදම් වශයෙන් රු.3,030 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි .

## 2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

### 2 . 1 . මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් රු.3,839,804 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් රු.61,954,464 ක් විය .

2.2 . මූල්‍ය පාලනය .

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ) . විවිධ ණය හිමියන් ගේ ගිණුමෙහි වූ රු.5,192,891 ක් වූ ගෙවිය යුතු මුදල් මෙම වාර්තාවේ දින දක්වාම ගෙවා නොතිබුණි .

( ආ ) . රු.113,743 ක් වූ මෙහෙයුම් සංවර්ධන ප්‍රදානය උපයෝජනය නොකොට විවිධ තැන්පතු ගිණුමෙහි රඳවා තිබුණි .

( ඇ ) . අදාල පර්ශවයන්ට සහ දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට නොගෙවා රු.2,658,051 ක මුදලක් විවිධ තැන්පතු ගිණමෙහි රඳවා තිබුණි .

2.3 . ආදායම් පරිපාලනය .

------------------------

2.3.1 . ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම .

----------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය . | 2011 | | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම . |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත<br>රු " 000 | තථ්‍ය<br>රු " 000 | රු " 000 |
| වරිපනම් සහ බදු | 5,070 | 2,625 | 5,611 |
| කල්බදු කුලී | 31,061 | 28,009 | 1,364 |
| බලපත්‍ර ගාස්තු | 1,040 | 1,685 | 28 |
| වෙනත් ආදායම් | 54,894 | 42,575 | 9,761 |
| එකතුව . | 92,065 | 74,894 | 16,764 |

========= ========== ======

2.3.2 . උසාවි දඩ හා මුද්දර ගාස්තු .

2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ වෙනත් ආයතනයන් ගෙන් ලැබිය යුතු මුදල් පහත පරිදි වේ .

| | | රු. |
|---|---|---|
| ( i ) . | උසාවි දඩ | 1,112,950 |
| ( ii ) . | මුද්දර ගාස්තු | 2,894,342 |

2.3.3 . ආදායම් ණයගැතියෝ.

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත සහ 1988 ප්‍රාදේශිය සභා ( මුල්‍ය සහ පරිපාලන ) රීති ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට වූ එකතුව රු.11,010,570 ක් වූ බදු , කුලි , වෙළඳ බලපත්‍ර සහ වෙනත් ආදායම් අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි .

2.4 . නිෂ්ක්‍රිය සහ ඌන උපයෝජිත භෞතික සම්පත් .

ආදර්ශ විගණන පරීක්ෂාවන් හිදි පහත සඳහන් කරුණු නිරික්ෂණය විය .

( අ ) . වටිනාකම රු.275,000 ක් වූ ලැන්ඩ් මාස්ටර් රථයක් වර්ෂ 4 කට අධික කාලයක් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවතුණි .

( ආ ) . වර්ෂය තුලදී මිලදි ගත් වටිනාකම රු.30,430,200 ක් වූ ඉඩම් 03 ක් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවතුණි .

2.5 . ආර්ථික නොවු ගනුදෙනු .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ). අතිකාල සහ නිවාඩු දින වැටුප් ගෙවිය හැක්කේ හදිසි සහ සාමාන්‍ය රාජකාරි කටයුතු වලින් සම්පූර්ණයෙන් පරිබාහිර වූ සහ කාර්යාල වේලාව තුළ නිමකළ නොහැකි විශේෂිත කටයුතු සඳහා පමණි . මෙම අවශ්‍යතාවයට පටහැනිව සභාව රු.53,610 ක් වූ අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි .

( ආ ). රැස්වීම් සඳහා සහභාගී වූ නිලධාරීන්ට ආහාර සැපයීම සඳහා රු.15,900 ක මුදලක් ගෙවා තිබුණු අතර ඉහත කාරණයේ දී ආර්ථිකවත් භාවය පිළිබඳ සංකල්පය සැලකිල්ලට ගෙන නොතිබූ බව විගණනයේ අදහස වේ .

2.6 . මෙහෙයුම් අකාර්යක්ෂමතා .

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ). වර්ෂ 05 කට අධික කාල පරිච්ඡේදයක් පැවති නිරවුල් නොකළ රු.47,132 ක් වූ සේවක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි .

( ආ ). ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි නොවූ පුද්ගලික ආයතනයකින් වටිනාකම රු.69,070 ක් වූ ආයුර්වේද ඖෂධ මිලදී ගෙන තිබුණි .

2.7 . අරමුණු වලට පරිබාහිර වූ ක්‍රියාකාරකම් .

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ ). පොන්ගල් උත්සවය සඳහා දුරෙයිඅප්පා ක්‍රීඩාංගනයට ජනතාව ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත රු.10,000 ක මුදලක් ගෙවා තිබුණි .

( ආ ). පළාත් පාලන කොමසාරිස් වරයා ගේ අනුමැතිය ලබා නොගෙන සභා අරමුදලෙන් රු.453,658 ක් වූ ආහාර පාන වියදම් ගෙවා තිබුණි .

2.8 . මතභේදයට තුඩුදෙන ගනුදෙනු .

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

( අ). අංක : පීටී / 01 / 2009 සහ 2009 ජනවාරි 28 දිනැති උතරු පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව 2010 වර්ෂය සඳහා අපහරණ මණ්ඩල කමිටු සාමාජිකයන් හට රු. 2,500 ක් වූ අපහරණ මණ්ඩල දීමනා ගෙවා තිබුණි .

( ආ ) . ධාවන සටහන් අනුව ලේකම්වරයා 2011 . 01 . 06 සිට 2011 . 01 . 09 දක්වා රාජකාර් සඳහා කොළඹ සිටිය ද , කසල ඉවත් කිරම සඳහා වූ මිල කැඳවීම් පිළිබඳ තීරණය සඳහා ලේකම්වරයා 2011 . 01 . 07 දින අත්සන් කර තිබුණු අතර කසල ඉවත් කිර්මේ ගාස්තු ලෙස රු.4,500 ක් ගෙවා තිබුණි .

2 .9 . කාර්ය සාධනය .

-------------------

සභාව මුදල් වර්ෂය ආරම්භයේ දි වාර්ෂික ක්‍රියාකාර් සැලැසුමක් පිළියෙල කර නොතිබුණි . එම නිසා සපුරා ගැනිමට අපේක්ෂිත අරමුණු සහ එහි ප්‍රගතිය සොයා දැනගත නොහැකි විය .

3 . පද්ධති හා පාලන .

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) . ආදායම් රැස් කිර්ම .
( ආ ) . ස්ථාවර වත්කම් .
( ඇ ) . ගිණුම්කරණය .
( ඈ ) . මානව සම්පත් . .
( ඉ ) . ප්‍රදාන සහ පර්ත්‍යාග .
( ඊ ) . වාහන උපයෝජනය .
( උ ) . විවිධ තැන්පතු .
( ඌ ) . අයවැය ලේඛණමය පාලනය .